## ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව - 2018

---

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ''මනාලෙස සැලසුම් කරන ලද'' අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 අනුව මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් සාධාරණ අගය (Fair Value) මත ඉදිරිපත් කල යුතු වුවද සංස්ථාව විසින් පිරිවැය රු.මිලියන 2,671.81 ක දේපල පිරියත උපකරණ වල සාධාරණ අගය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි. | විගණකාධිපති වාර්තාව මඟින් අවස්ථා කිහිපයකදී දේපල, පිරියත උපකරණ වල තක්සේරු අගය පෙන්වීමට යෝජනා කර ඇති බැවින් ඉදිරියේදී මේ සඳහා අදාළ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සංස්ථාවේ වත්කම්වල ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කිරීමේ කටමිටුව විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් ප්‍රයෝජනයට ගත නොහැකි බව හඳුනාගත් රු.මිලියන10.79 ක් පිරිවැය වූ යන්ත්‍ර උපකරණ හා මෝටර් රථ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 05 ට පටහැනිව තවදුරටත් ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | යන්ත්‍ර උපකරණ හා මෝටර් රථ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංකය 05 අනුව ජංගම වත්කම් ලෙස වර්ග කිරීමට 2019 ගිණුම් ප්‍රකාශ පිළියෙළ කරන අවස්ථාවේදී අප පියවර ගන්නෙමු. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව වත්කම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් පිරිවැය රු.මිලියන 92.48 ක ආයෝජන දේපලක සාධාරණ අගය ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. එමෙන්ම සංස්ථාව කුලී පදනම මත බාහිර පාර්ශවයන් වෙත ලබා දී තිබුණු ඉඩම්, ආයෝජිත දේපළ ලෙස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබූ අතර එම ඉඩම්වල වටිනාකම පිළිබඳ තොරතුරුද විගණනයට පැහැදිලි නොකෙරුණි. | ඉදිරියේදී වෙනත් අවශ්‍යතාවයකට මෙහි සාධාරණ අගය ගණනය කල විට එය පදනම්ව ඉඩමේ සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව ආයෝජන දේපළවල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කළ යුතුය. |
| (ඈ) | සංස්ථාව විසින් පිරිවැය රු.මිලියන 587.49 සහ ලියාහල අගය රු. 304 ක් වූ වර්ග කීපයකට අයත් වත්කම්වල ඵලදායි ජීවිත කාලය සමාලෝචිත වර්ෂයේදි නැවත තක්සේරු කර තිබුණි. එලෙස ඵලදායී ජීවිත කාලය නැවත තක්සේරු කරන ලද වත්කම්වලට අදාළ සමුච්චිත ක්ෂය වෙන් කිරීමේ ගිණුමේ ශේෂයන් රු. මිලියන 160.34 ක් රඳවාගත් ලාභයට | මෙය ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීමක් බැවින් එම වෙනස්වීම සමාලෝචිත වර්ෂයට අදාලව (prospectively) මූල්‍ය ප්‍රකාශන තුල ගැලපීම් සිදු කල අතර මෙමඟින් ගිණුම්කරණ ප්‍රමිතීන් උල්ලංඝනය වීමක් සිදුව නොමැත.<br>සංස්ථාවේ පළපුරුදු වරලත් යාන්ත්‍රික ඉංජිනේරුවරුන්ගෙන් සමන්විත | වත්කම්වල ජීවිත කාලය නැවත තක්සේරු කිරීමේ ප්‍රතිඵලය ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත අනුව ගැලපීම් කර මූල්‍ය ප්‍රකාශනවල තුළ ඉදිරිපත් කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගැලපීම් නොකර සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදමෙන් අඩු කර දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින්ම අධිගණනය වී තිබුණි. එමෙන්ම වත්කම්වල ඵලදායි ජීවිත කාලය නැවත තක්සේරු කිරීම බාහිර විශේෂඥ දැනුම ඇති පාර්ශවයන් සම්බන්ධ කර ගැනීමකින් තොරව සංස්ථාවේ නිලධාරින් තිදෙනෙකු විසින් සිදුකර තිබූ බැවින් අදාල තක්සේරු කිරීම්වල නිවැරදිතාවය පිළිබඳ විගණනයේදී ප්‍රශ්නකාරි විය. | කණ්ඩායමක් මේ සඳහා යොදා ගන්නා ලදී. එබැවින් වත්කම් වල ඉදිරි ඵලදායී ආයුකාලය තීරණය කිරීම සාධාරණව සහ නිවැරදිව සිදු කර ඇති බවට විශ්වාස කරමු. | |

### 1.5.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 2.5.1 (ඉ) පරිදි සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ කොන්ත්‍රාත් ආදායම කොන්ත්‍රාත්වල කාර්ය සාධනය (Performance Obligation) ඇගයීම මත හඳුනාගන්නා බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට කොන්ත්‍රාත් 21 ක කළ වැඩ, ඉංජිනේරුවරයකුගේ සහතික කිරීමකින් තොරව ඉදිරිපත් කළ බිල්පත්වල කළ වැඩ වටිනාකම පදනම්කරගෙන කොන්ත්‍රාත් අදායම රු.මිලියන 951.05 ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර තිබුණු අතර මෙම අගය මුළු කොන්ත්‍රාත් ආදායමේ ප්‍රතිශතයක් ලෙස සියයට 75 ක් විය. | සමාලෝචිත වර්ෂය සඳහා ගිණුම්ගත කරන ලද සියලුම ව්‍යාපෘති ආදායම් සේවාදායකයා විසින් සහතික කරනලද වටිනාකම් වන අතර සහතික නොකරන ලද කිසිදු වටිනාකමක් ආදායමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. බොහෝ අවස්ථාවලදී ඉදිරිපත් කරන ලද බිල්පත් සඳහා සේවා දායකයා විසින් ගෙවීම් සිදුකිරීම මගින් එම ව්‍යාපෘතියට අදාල වැඩ සහතික කර ඇති බව තහවුරු වේ. | ගිණුම් ප්‍රතිපත්ති /ගිණුම් ප්‍රමිත අනුව කොන්ත්‍රාත් ආදායම කාර්ය සාධන වගකීම මත මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංස්ථාවේ තොග පොත් යාවත්කාලීනව පත්වාගෙනයාමට කටයුතු කර නොතිබුණු අතර මේ හේතුවෙන් ඉකුත් වර්ෂය අවසානයට රු. මිලියන 267.32 ක් ව පැවති සෙමින් සංචලනය වන තොගයේ (Slow Moving Stock) සමාලෝචිත වර්ෂය අවසානයට වූ තත්‍ය ශේෂය හා එහි විචලනයන් විගණනයේදී හඳුනාගත නොහැකි විය. | ක්‍රියාත්මක කරමින් පවතින නව පරිඝණක දත්ත සැකසුම් පද්ධතිය (SAP Business One) මගින් ඉදිරියේදී සෙමින් චලනය වන තොගයේ විචලනයන් වඩාත් විස්තරාත්මකව සහ නිවැරදිව හඳුනාගත හැකි වනු ඇත . | සංස්ථාවේ පවතින සෙමින් චලනය වන තොගයේ වටිනාකම නිවැරදිව හඳුනාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වත්තල මා බෝල නගර සභාව විසින් කෙරවලපිටිය කසළ කළමනාකරණ අංගනය වෙත බැහැර කරන ලද කසල වෙනුවෙන් මුදල් අය නොකිරීමට සංස්ථාව තීරණය කර තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂය අවසානයට එම ආයතනයෙන් ලැබිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.මිලියන 13.04 ක මුදල හා ඒ වෙනුවෙන් වෙන් කර තිබුණු රු.මිලියන 6.69 ක් අඩමාන ණය ශේෂය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගිණුම් පොත්වල දැක්වෙන ශේෂයන් ඊට පෙර කාලය සඳහා ගිණුම්ගත කල බිල්පත් වන අතර එම ශේෂයන් පොත්වලින් කපාහැරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. | තවදුරටත් අයකරගෙන නොමැති ශේෂයන් පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී කෙරවල පිටිය කසළ කළමනාකරණ අංගනය වෙත කසළ බැහැර කරනු ලබන පාරිසරික සේවා ආයතනයක් විසින් රු.100,000 ක ආපසු ගෙවනු ලබන තැන්පතුවක් සංස්ථාවට ලබාදී තිබුණද එම තැන්පතුව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කිරීමට 2019 වර්ෂයේ වාර්ෂික ප්‍රකාශ පිළියෙළ කරන අවස්ථාවේදී කටයුතු කරනු ඇත. | වර්ෂය තුළ සිදුකරනු ලැබූ සියලුම ගණුදෙනු සහ ඊට අදාළ වගකීම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් විය යුතුය. |
| (ඈ) | පිරිවැය රු. මිලියන 1.30 ක් වූ සංස්ථාවේ ප්‍රධාන කාර්යාලයෙහි පැවති ආපනශාලාව වසර 9 කට පෙර කඩා ඉවත් කර ඇතත් එම වටිනාකම ගිණුම්වලින් ඉවත් නොකර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවලද දක්වා තිබුණි. | ඔබගේ අදහස සමඟ අප එකඟ වෙමු . 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී අවශ්‍ය ගැලපීම් කරනු ඇත . මෙම ගොඩනැගිල්ල වර්ෂ 2002 සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇත . | මූල්‍ය ප්‍රකාශනවල දක්වන වත්කම් නිවැරදිව හඳුනාගෙන පවතින වත්කම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | දැදුරුඔය ජලාශයේ ජලය පවිත්‍රකිරීමේ කොන්ත්‍රාත්තුව අදාළව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සහතික කරන ලද වැඩ වටිනාකම රු.මිලියන 26.41 ක් වුවද, එම වටිනකාම රු.මිලියන 27.96 ක ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් කොන්ත්‍රාත් ආදායම රු.මිලියන 1.55 කින් අධිගණනය වී තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වන අතර එය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදුකිරීමට එකඟ වෙමි. | නිවැරදිව ආදායම හඳුනාගැනීමට කටයුතු කර නිවැරදි ආදායම පමණක් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ඊ) | කෙරවලපිටිය කසළ අංගනය ඉදිකරීම සඳහා ජනාධිපති අරමුදලින් සංස්ථාවට ලැබුණු රු. මිලියන 123.84 ක ප්‍රදාන මූල්‍ය ප්‍රකාශනවල විලම්භිත ආදායම් වගකීම් යටතේ (Differed Income) දක්වනු වෙනුවට එම වටිනාකම අත්තිකාරම් යටතේ දක්වා තිබුණි. | මෙය 2019 වර්ෂයේදී නිවැරදි කර ඇත. | ප්‍රදාන නිවැරදිව හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | සංස්ථාව සතු ඕරුගොඩවත්ත, ප්‍රදේශයේ පිහිටි ඉඩම් කැබලි 05 ක් වාර්ෂික බදු කුලී පදනම මත බදු දී තිබුණද, ඒ සඳහා බදු ගැනුම්කරුවන් සමඟ 2012 වර්ෂයේ සිට බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි. එමෙන්ම 2018 මැයි 15 දින ඉඩම් කැබලි 05 හි නව බදු කුලී වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබුණු බැවින් 2017 පෙබරවාරි 24 දින සිට නව තක්සේරුව මත බදු කුලී අයකර ගත යුතුව තිබුණි. එම මුදල් අයකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණු අතර ලැබිය යුතු ආදායම ගිණුම්ගත කිරීමටද කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු බදු මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස අදාළ පාර්ශවයන් වෙත දන්වා ඇති අතර සිහිකැඳවීම්ද යොමුකර ඇත. තවදුරටත් අදාළ මුදල් නොගෙවන්නේ නම් නීති මගින් ක්‍රියා කිරීමට කටයුතු කරනු ලැබේ. | බදු ගැණුම්කරුවන් සමග නියමිත පරිදි ගිවිසුම්වලට එළඹිය යුතු අතර ගිවිසුම් ප්‍රකාරව ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය . |
| (ඌ) | සංස්ථාව විසින් 2012 වර්ෂයේ සිට භාවිතයට ගනු ලබන එක්ස්කැවේටර් යන්ත්‍රයක සහ බෝට්ටු 02 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණු අතර 2010 වර්ෂයේදී සංස්ථාව සතු ට්‍රැක්ටර් ට්‍රේලර 04 ක්, බවුසර් රථ ලෙස නවීකරණය කළද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි.<br>මෙම එක්ස්කැවේටර් යන්ත්‍රය,බෝට්ටු දෙකෙහි හා ට්‍රේලර් බවුසර් 04 හි වටිනාකම තක්සේරු කර 2019 වර්ෂය තුලදී මූල්‍ය ප්‍රකාශන වලට ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | සංස්ථාව සතු වත්කම් නියමිත පරිදි තක්සේරු කර එම වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (එ) | සමාලෝචිත වර්ෂයේදි සංස්ථාව විසින් වැඩ අවසන් කරන ලද කුරුණෑගල ජල සම්පාදන ව්‍යාපෘතියෙන් ලැබිය යුතු සියලුම මුදල් සේවාදායකයාගෙන් අය වී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයට එම ව්‍යාපෘතියෙන් තවදුරටත් අයවිය යුතු මුදලක් ලෙස රු.මිලියන 1.54 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මෙම නිසා හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ණය ගැති වටිනාකම එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. | ගිණුම් සටහන් තැබීමේදී ඇතිවූ දෝෂයක් නිසා මෙය සිදුවී ඇති අතර එය නිවැරදි කිරීමට මෙම වසරේදී කටයුතු කරනු ඇත. | මූල්‍ය ප්‍රකාශනවල දක්වන ශේෂයන් ගිණුම් ගත කිරීමට ප්‍රථම එම වටිනාකම්වල නිවැරදි බව තහවුරු කර ගත යුතුය. |

### 1.5.5 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | රු.මිලියන | රු.මිලියන | | |
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාව ඉටුකළ | 1,559.62 | 1,432.55 | 127.07 | අනුමත රේටයන්ට අනුව 2018 වර්ෂය සඳහා නිර්දේශිත මුදල | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අයිතම වටිනාකම් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | මහා භාණ්ඩාගාර ව්‍යාපෘති 64 ක් වෙනුවෙන් දරන ලද වියදම | | | | වූයේ රුපියල් මිලියන 1,348 ක් පමණි. ඒ අනුව මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල ව්‍යාපෘති වලින් සංස්ථාවට වූ දළ අලාභය රුපියල් මිලියන 112 කි. | එයට අදාළ උපලේඛන සමග සසදා නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | සංස්ථාව අත්පත් කරගත් ඉඩම් සඳහා ගෙවිය යුතු වන්දි | 41.86 | 42.87 | 1.01 | රුපියල් මිලියන 1.01 වන නැවත පදිංචිකරුවන්ගේ පවුල් සඳහා වන හිමිකම් ඔප්පු ලබාදීම වෙනුවෙන් වැය වෙතැයි අපේක්ෂා කරන මුදල් මෙහි ඇතුලත් නොවේ. | මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති අයිතම වටිනාකම් එයට අදාළ උපලේඛන සමග සසදා නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.5.6 අධිකාරී බලය නොලත් ගනුදෙනු

| | අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තරය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ සංස්ථාව රු. මිලියන 1,533 ක ස්ථාවර තැන්පත් නිදහස් කර ගෙන තිබුණද ඒ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මින් ඉදිරියට ස්ථාවර තැන්පතු ආයෝජනය ඉවත් කර ගැනීමේදී සහ ආයෝජනය කිරීමේදී අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන්නෙමු. | ප්‍රමාණාත්මක ආයෝජන නිදහස් කර ගැනීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගත යුතුය. |
| (ආ) | මහකොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජල රැඳවුම් ප්‍රදේශ ලෙස වෙන්කර තැබීමට සංස්ථාව විසින් පවරාගත් නාවල - හීන් ඇල ජල රක්ෂිත ප්‍රදේශ තුල පැවති හෙක්ටයාර 02 ක භූමි ප්‍රමාණයක රු. මිලියන 173.70 ක් වැය කර සංස්ථාව විසින් ක්‍රිකට් ක්‍රීඩාංගනයක් ඉදිකර තිබුණු නමුත් ඒ සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගෙන නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම ක්‍රීඩාංගනය භාවිතයට ගෙන නොතිබුණි. | මෙහි ප්‍රකාර භූමි ප්‍රදේශය ජල රැඳවුම් ප්‍රදේශයක් වශයෙන් ක්‍රියාත්මක වන අතර වියළි කාලගුණික තත්වයන්හිදී Dry Weathered Play Ground එකක් වශයෙන් භාවිතා කල හැකි පරිදි සංවර්ධනය කොට ඇත. මෙම සංවර්ධිත ක්‍රිඩාංගණය සංස්ථාවේ හා ඒ හා අනුබද්ධ ආයතන වල සේවක පිරිසගේ ක්‍රිඩා කෞශල්‍යා ඔප් නැංවීමේ අවශ්‍යතා වෙනුවෙන් කරනු ලබන ක්‍රිඩා කටයුතු සඳහා භාවිතා කරනු ලබයි. | සංස්ථාව පවරාගත් ජල රක්ෂිත ප්‍රදේශ එම අරමුණ වෙනුවෙන් භාවිතා කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සංස්ථාවේ කෙරවලපිටිය කසළ කළමනාකරණ අංගනය වෙත ආයතන 25 ක් විසින් බැහැර කරන ලද කසළ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අයවිය යුතුව පැවැති මුදල රු.මිලියන 301.12 ක් වූ අතර මෙයින් රු.මිලියන 110.00 ක් වර්ෂ එකට අඩු සහ රු.මිලියන 191.06 ක් වර්ෂ එකත් දෙකත් අතර කාලයක සිට හිඟව පැවතුණි. කෙසේ වුවද සංස්ථාව විසින් අදාළ ආයතන සමඟ කසළ බැහැර කිරීමට අදාළ කොන්දේසි ඇතුළත් ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබීම නිසා මෙම ණය අයකර ගැනීම දුෂ්කර වී තිබුණි. | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ විෂය පථයට කසළ කළමනාකරණය අයත් නොවන බැවින් අනෙකුත් පළාත් පාලන ආයතන සමග කසළ භාරගැනීම වෙනුවෙන් ගිවිසුමකට එළඹීම ගැටලු සහගත බැවින් කසළ මෙට්‍රික් ටොන් එකක් සඳහා රු. 3,000/= කට යටත්ව කසළ බැහැර කිරීම සඳහා අවසර ලබාදී තිබුණි.<br>එහෙත් මෙට්‍රික් ටොන් එකක් සඳහා රු. 3,000/= ක මුදලක් ගෙවීම අපහසු බව පළාත් පාලන ආයතන වරින් වර අපවෙත දන්වා එවා ඇති වුවද අපගේ සම්පූර්ණ හිඟ මුදල ගෙවන ලෙස දන්වා අප විසින් වරින් වර එම ආයතන ලිඛිතව දැනුවත් කර හැකි පමණින් හිඟ මුදල් පියවාගෙන ඇත. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) වෝටර්ස් ඒජ් ආයතනයට සංස්ථාව ලබා දී තිබූ දූම්රිය ආපනශාලාව වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවට අයවිය යුතු රු. මිලියන 88.42 ක් සහ එයට අදාළ පොළිය රු. මිලියන 14.50 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ලැබී නොතිබුණි. එමෙන්ම මෙම ගණුදෙනුවට අදාළ දෙපාර්ශවය අතර ගිවිසුමක් ඇතිකර ගෙන නොතිබුණි. තවද මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් මහා භාණ්ඩාගාර මුදලින් වැය කරන ලද රු. මිලියන 37.02 ක් අය කර ගැනීමටද සංස්ථාව කටයුතු කර නොතිබුණි. | මෙම මුදල වෝටර්ස් එජ් ආයතනයෙන් අයකර ගැනීමට තවදුරටත් කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් වැඩ අවසන් කර තිබුණු ව්‍යාපෘති 5 කට අයත් රු. මිලියන 266.84 ක් වූ කොන්ත්‍රාත් කටයුතුවල අවසාන බිල්පත ඉදිරිපත් කර මාස 05 ත් 11 ත් අතර කාලයක් ගත වුවද ඒ වෙනුවෙන් සංස්ථාව දරන ලද රු. මිලියන 73.35 ක් සංස්ථාවට අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | ජනාධිපති ලේකම් කාර්යාලය මගින් ලබාදුන් "පුබුදමු පොලොන්නරුව" වැඩසටහන යටතේ පොලොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ගෙවීම් කටයුතු කරන ලද ව්‍යාපෘති සඳහා මහා භාණ්ඩාගාරයෙන් නිසි කලට මුදල් ලබා නොදීම හේතුවෙන් ගෙවීම් කටයුතු ප්‍රමාද විය. | කොන්ත්‍රාත් වෙනුවෙන් සංස්ථාවට ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඈ) | එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසාන වන විට සම්පූර්ණයෙන් වැඩ අවසන් කළ රු.මිලියන 254.92 ක කොන්ත්‍රාත් 4 ක් සඳහා රු. මිලියන 210.08 ක බිල්පත් සංස්ථාව ඉදිරිපත් කර තිබුණද ඒ වෙනුවෙන් කිසිදු මුදලක් සංස්ථාවට ලැබී නොතිබුණි. මෙයින් රු. මිලියන 165.97 ක් ඉකුත් වර්ෂයේ වැඩ අවසන් කළ කොන්ත්‍රාත් කටයුතු වෙනුවෙන් ලැබිය යුතු වටිනාකම් විය. | ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් මුදල් ලබා දීමේ දී ඇති වූ ප්‍රමාදය හේතුවෙන් වසර අවසානයේදී ඉදිරිපත් කර තිබූ බිල්පත් සඳහා මුදල් ගෙවීම් ප්‍රමාද විය. මේ වන විට වසර අවසානයේ තිබූ නොපියවූ බිල්පත් ගෙවා අවසන් කර ඇත. | කොන්ත්‍රාත් වෙනුවෙන් සංස්ථාවට ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඉ) | සංස්ථාව විසින් ඉකුත් වර්ෂවල ඉටුකරන ලද කොන්ත්‍රාත් 12 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සංස්ථාවට අයවිය යුතු රු. මිලියන 52.90 ක් බොල් ණය ලෙස කපා හැරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණු අතර සංස්ථාවේ ප්‍රමාණ පත්‍රවල සඳහන් මිල රේටයන් අනුමත නොකිරීම, කොන්ත්‍රාත් අතර මග නවතා දැමීම, රඳවාගත් මුදල් කාලීනව අයදුම් නොකිරීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානය වන විට සේවාදායකයින්ගෙන් සංස්ථාවට අයවිය යුතු වර්ෂ | අයකරගත නොහැකි මට්ටමේ පවතින ණයගැති ශේෂයන් සැලකියයුතු ප්‍රමාණයක් හඳුනාගෙන ඇති අතර ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ගයන් ඉදිරියේදී ගැනීමට බලාපොරොත්තු වේ. | කොන්ත්‍රාත් වෙනුවෙන් සංස්ථාවට ලැබිය යුතු ණය අයකර ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම තත්ත්වයට පත්කර ණය අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | 05 ඉක්මවූ ණය ශේෂ රු. මිලියන 40.89 ක් වූ අතර වර්ෂ 05 ත් 10 ත් අතර අයවිය යුතු වටිනාකම රු. මිලියන 14.34 ක් විය. මෙම ශේෂයන්ද කඩිනමින් අයකර ගැනීමට සංස්ථාව ක්‍රියාමාර්ග නොගතහොත් එම විටනාකම්ද සංස්ථාවට අහිමි වීමේ වැඩි අවධානමක් පවතින බව වැඩි දුරටත් විගණනයේදී අනාවරණය විය. | | |
| (ඊ) | මැදමුලන ඩී.ඒ. රාජපක්ෂ අනුස්මරණ මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් රු. මිලියන 47.36 ක් ලැබිය යුතු බව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද එම ආයතනයේ ශේෂ සනාථ කිරීම් අනුව සංස්ථාවට කිසිදු මුදලක් ගෙවීමට නොමැති බව දන්වා තිබුණි. | මේ සම්බන්ධයෙන් නඩු කටයුත්තක්ද ක්‍රියාත්මක වන බැවින්, එම නඩු කටයුත්ත අවසානයේ තවදුරටත් මෙම සංස්ථාවට ලැබිය යුතු මුදල නිශ්චිත වශයෙන් තහවුරු වනු ඇත. | ලැබිය යුතු මුදල පිළිබඳ අදාළ ආයතනය සමග සාකච්ඡා කර අයකර ගැනීම් කඩිනම් කළ යුතුය. |
| (උ) | සංස්ථාව සතු කිඹුලාවෙල පැවැති ආපන ශාලාව සමාගමකට බදු දීම මත ඉකුත් වර්ෂයේ සිට සංස්ථාවට අයවිය යුතු රු. මිලියන 24.58 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට සංස්ථාවට නොහැකි වී තිබුණි. | ඒ සඳහා වැයකර ඇති මුදල් ලබා ගැනීම සඳහා අප විසින් අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කලද එම ඉඩම ඔවුන් වෙත පැවරීමෙන් පසු අදාල මුදල් ලබා දිය හැකි බව අප වෙත දන්වා ඇත. | ලැබිය යුතු මුදල පිළිබඳ අදාළ ආයතනය සමග සාකච්ඡා කර අයකර ගැනීම් කඩිනම් කළ යුතුය. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

---------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථා පනතේ 3අ(1) වගන්තිය යටතේ සංස්ථාවට පවරාගෙන පසුව විකිණීම් මගින් බැහැර කරන ඉඩම් වෙනුවෙන් ඉඩම් කොමසාරිස්වරයා වෙත සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු මුදල රු. මිලියන 49.62 ක් වූ අතර එම මුදල් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත යොමු කිරීමට කටයුතු කරමින් පවතී. | බාහිර ආයතනවලට ගෙවිය යුතු මුදල් කඩිනමින් ගෙවීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවට ලබාදී තිබුණු අත්තිකාරම් මුදල රු.මිලියන 413.80 ක් වූ අතර ඉන් වසර 4 ත් 5 ත් අතර ශේෂය රු. මිලියන 55.9 ක්ද වසර 2 – 3 ත් අතර ශේෂය රු. මිලියන 55.7 ක් විය. | මිල රේටයන් අනුමත කිරීමේද ඇතිවූ ප්‍රමාදයන් නිසා අවසන් බිල් පත නිරවුල් කිරීමට ප්‍රමාද විය මේවන විට අවසන් බිල්පත නිරවුල් කිරීම අවසන් අදියරට පැමිණ ඇති හෙයින් ඒ සමගම එම ශේෂයද නිරවුල් වී යනු ඇත. | වැඩ පූර්ව අත්තිකාරම් අතුරු බිල්පත්‍ර ඉදිරිපත් කිරීමේදී ගිවිසුම් ප්‍රකාරව පියවීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | හම්බන්තොට සේවා මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් 2014 වර්ෂයේදී සංස්ථාවට ලබාදී තිබුණු රු. මිලියන 68 ක වැඩ පූර්ව අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතියේ කටයුතු අතර මඟ නවතා දමා තිබුණි. | මෙම බිල්පතෙහි වැඩ සහතික කිරීම සඳහා උපදේශක ආයතනය වශයෙන් යෝජිත ගොඩනැගිලි දෙපාර්තමෙන්තුව හා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය අතර තිබිය යුතු උපදේශන ගිවිසුමට (Consultancy Agreement) අත්සන් තබා නොතිබූ බැවින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් එම බිල්පත සහතික කිරීම ප්‍රතික්ෂේප කර ඇති බව දැනගන්නට ලැබුණි. | වැඩ පූර්ව අත්තිකාරම් අතුරු බිල්පත්‍ර ඉදිරිපත් කිරීමේදී ගිවිසුම් ප්‍රකාරව පියවීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ) | • මෙකී විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 67 කදී රු.100,000 ඉක්මවා රු.14,297,500 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. එසේම මූල්‍ය සීමාවන් ඉක්මවා ගෙවීම් කිරීම සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබාගන්නා බවට ඉකුත් වර්ෂයේදී දන්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි. | තත්කාල අතුරු අග්‍රිම සීමාවන් වැඩි කිරීමට අනුමැතිය සඳහා මහා භාණ්ඩාගාරයට මේ වන විට ලිපියක් යොමු කර ඇත. | මුදල් රෙගුලාසිවල සඳහන් නියමයන්ට අනුව අත්තිකාරම් ලබාදීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | • තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය යුත්තේ කිසියම් විශේෂිත කාර්යයක් සඳහා වුවද, සංස්ථාවේ සාමාන්‍ය කටයුතු වන ඉදිකිරීම් සහ ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය අනුගමනය කරමින් සිදුකළ යුතු කාර්යයන් සඳහා ද සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 57 ක දී රු.12,731,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි. | | |
| (ii) සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) | සමාලෝචිත වර්ෂයේ ලබාදුන් තත්කාර්ය අතුරු අග්‍රිමවලින් වියදම් නොවී ඉතිරිව පැවති අග්‍රිම 03 කට අදාල රු.270,000 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි. තවද අදාල කාර්යය අවසන් වී දින 10 ක් ඇතුළත එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවද නියැදි විගණන පරීක්ෂාවට ලක්වූ අවස්ථා 26 කදී රු.5,749,000 ක අතුරු අග්‍රිම පියවීම සඳහා දින 31 සිට දින 94 ක් දක්වා කාලයක් ගතකර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුළ ලබාදී තිබූ අග්‍රිම 14 කට අදාල රු.776,000 ක් නියමිත කාර්යය සඳහා වැය නොකර දින 01 සිට දින 59 ක් දක්වා වූ කාලයක් නිලධාරියා ලඟ තබාගෙන මුළු මුදලම නැවත බැංකු ගතකර තිබුණි. | මේ වන විට අප සියලු තත්කාල අතුරු අග්‍රිම දින 10 ක් තුල පියවීමට කටයුතු කරනු ඇත. එසේම, සිහි කැඳවීමේ ලිපියක්ද සකස් කොට ඇත. | මුදල් රෙගුලාසිවල සඳහන් නියමයන්ට අනුව අත්තිකාරම් ලබාදීමට සහ පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 1971 අංක 38 දරන මුදල් පනත 11 (බී) වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදි අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ස්ථාවර හා කෙටිකාලීන තැන්පත්වල රු.මිලියන 3,737.85 ක් ආයෝජනය කර තිබුණි. | පවතින අතිරික්ත මුදල්, අතිරේක ආදායමක් උපයනු පිණිස ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ස්ථාවර තැන්පතු ගිනුමක ආයෝජනය කර ඇත. | අතිරික්ත මුදල් ආයෝජනය සම්බන්ධ මුදල් ඇමතිවරයාගේ එකඟතාවය හා මහාභාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඇ) 1982 අංක 04 දරන නාගරික සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනතේ 8 (ඒ) වගන්තිය | අදාළ පළාත් පාලන ආයතනය වෙතින් අනුමැතිය ලබාගැනීමකින් තොරව සංස්ථාව විසින් නව ප්‍රධාන කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකර තිබුණි. මෙම නිසා ඉදිරි වර්ෂ වලදී අනුමැතිය ලබාගැනීම වෙනුවෙන් රු.මිලියන 12.04 ක පමණ බැරකමක් උද්ගතව තිබුණි. | නගර සභාවේ උපදෙස් පරිදි පහත සඳහන් ආයතනවල අවසර ලබාගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇත.<br>• ගිනි ආරක්ෂණ දෙපාර්තමේන්තු<br>• මධ්‍යම පරිසර අධිකාරිය | නාගරික සංවර්ධන පනතේ විධිවිධාන අනුව අනුමැතිය ලබාගත යුතු සියළුම අයතනවලින් අනුමැතිය ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | • නාගරික සංවර්ධන අධිකාරිය | |
| (ඇ) 1995 ජුලි 12 දිනැති අංක එස්ජී1/එ/4/34 දරන රජයේ ඉඩම් අන්සතු කිරීමේ මාර්ගෝපදේශය | (i) මාර්ගෝපදේශ විධිවිධානවලට පටහැනිව සංස්ථාව ඉඩම් කල්බදු දීමේදී රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තක්සේරු කරන ලද කල්බදු වටිනාකම, විශේෂ කමිටුවක් මගින් නැවත ඇගයීමට ලක්කර නොතිබුණි. | වර්තමානයේද එවැනි කමිටුවක් ක්‍රියාත්මක වන බවට වාර්තා නොවේ. | ඉඩම් අන්සතු කිරීමේ මාර්ගෝපදේශයෙහි ඇතුළත් උපදෙස් පිළිපැදිය යුතුය. |
| | (ii) එමෙන්ම නිවාස ව්‍යාපෘතියක් ඉදිකිරීම වෙනුවෙන් සංස්ථාව සතු ඉඩමක් විකුණුම් ගිවිසුමක් මත 2007 වර්ෂයේදී පෞද්ගලික සමාගමකට ලබාදී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සමාගම එම නිවාස ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු නමුත් එම ඉඩම නැවත සංස්ථාවට අත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නීතිපති උපදෙස් අනුව ඉඩමෙහි භුක්තිය ලබාගැනීමට කටයුතු කරමින් පවතී. | මාර්ගෝපදේශය තුළ ඇතුළත් උපදෙස් පිළිපැදිය යුතුය. |
| (ඉ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/ 12දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.7 වගන්තිය | භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩලය වෙත රු.මිලියන 41.10 ක් දිරි දීමනා ගෙවා තිබුණි. | කාර්යය මණ්ඩලයට අභිප්‍රේරණ ක්‍රියා මාර්ගයක් වශයෙන් දිරි දීමනා ගෙවීමට අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය සහිතව ඉහළ කළමණාකාරීත්වය තීරණය කර ඇත. | චක්‍රලේඛන විධි විධාන ප්‍රකාරව දිරි දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතුය. |
| (ඊ) 2015 මැයි 25 දිනැති අංක පීඊඩී1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | චක්‍රලේඛයේ සඳහන් අනුමත ඉන්ධන සීමාව ඉක්මවා සහ අදාල අනුමැතීන් ලබා ගැනීමෙන් තොරව සංස්ථාවේ නිලධාරීන් 12දෙනෙකු වෙනුවෙන් රු. 1,173,051 ක් වටිනා ඉන්ධන ලීටර 9,537 ක් සමාලෝචිත වර්ෂයේදි ලබා දී තිබුණි. | මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | චක්‍රලේඛන විධි විධාන අනුව කටයුතු කර සංස්ථාවේ ඉන්ධන වියදම පාලනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළදී සමූහයේ හා සංස්ථාවේ බදුපෙර ලාභය පිළිවෙලින් රු.මිලියන 1,683.74 ක් හා රු.මිලියන 1,620.29 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය පිළිවෙලින් රු.මිලියන 1,541.94 ක් හා රු.මිලියන 1,500.01 ක් විය. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ සමූහයේ හා සංස්ථාවේ බදුපෙර ලාභයෙහි පිළිවෙලින් රු.මිලියන 141.80 ක හා රු.මිලියන 120.28 ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂය සමග සැසැදීමේදි වැලි විකුණුම් ආදායම රු. මිලියන 432 කින් සහ මූල්‍ය ආදායම රු. මිලියන 161 කින් ඉහළ යාම මෙම බදු පෙර ශුද්ධ ලාභයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

------------------------------------------------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරකට අදාලව ආයතනයේ මූල්‍ය ප්‍රතිඵල ඇගයීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණ විය.

(අ) 2014 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඍජු වියදම් වර්ෂ හතරක කාලයක් තුල සියයට 39 කින් වර්ධනය වී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය සමග සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේදි අධ්‍යක්ෂ පාරිශ්‍රමික සියයට 207 කින් ඉහළ ගොස් තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ සමස්ථ ආදායමෙන් සියයට 67 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් හා සියයට 33 ක් රජයේ ප්‍රදානයන්ගෙන් උත්පාදනය කර ගෙන තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදි සමාලෝචිත වර්ෂයේ ඉඩම් විකුණුම් ආදායම සහ ඉදිකිරීම් කටයුතු වලින් ලද ආදායම පිළිවෙලින් සියයට 65 කින් සහ සියයට 15 කින් පහළ ගොස් තිබුණි.

### 2.3 අනුපාත විශ්ලේෂණය

---------------------------

(අ) ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී ශුද්ධ ලාභ අනුපාතය සියයට 4 කින් වර්ධනය වී තිබුණු අතර මෙම තත්ත්වයට මුහුදු වැලි සහ මූල්‍ය ආදායම ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වගකීම, මුළු වත්කම් වල හා මුළු වගකීම් වල ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 40 ක් හා සියයට 60 ක ඉහළ අගයක් නියෝජනය කෙරුණි.

**3.		මෙහෙයුම් සමාලෝචනය**

**3.1		හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුහුදු වැලි ගොඩ දැමීමේ ව්‍යාපෘතියේ ගෙවීම් කටයුතු සඳහා සංස්ථාව විසින් 2010 වර්ෂයේදී ආරම්භ කරන ලද එක්සත් ජනපද ඩොලර් බැංකු ගිණුම 2012 පෙබරවාරි දක්වා ගණුදෙනු සඳහා භාවිතා කර ඉන් අනතුරුව එය අක්‍රිය ගිණුමක් ලෙස පවත්වාගෙන ගොස් තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ගිණුමේ ශේෂය එ.ජ. ඩොලර් මිලියන 2.05 ක් හෙවත් රු. මිලියන 375.51 ක් විය. එසේ වුවත්, සමාලෝචිත වර්ෂයේ මුහුදු වැලි නැවත ගොඩ දැමීම වෙනුවෙන් විදේශිය සමාගමකට සිදු කළ ගෙවීම් සඳහා මෙම ගිණුම භාවිතයට නොගෙන ශ්‍රීලංකා රුපියල් ඩොලර්වලට මාරු කර ගෙවීම් කර තිබීම විගණනයේදි ප්‍රශ්නකාරි විය. තවද මෙම හේතුවෙන් සංස්ථාවට විනිමය අලාභයක් සහ අතිරේක බැංකු ගාස්තුවක් ගෙවීමටද සිදුවී තිබුණි. | සංස්ථාව වෙනුවෙන් දැනට මුහුදු වැලි ගොඩ දමනු ලබන කොන්ත්‍රාත්කරුගේ බිල්පත් ගෙවීමට මෙම මුදල භාවිතා කිරීමට හැකි බවට අධ්‍යක්ෂක මණ්ඩලයට යෝජනා කල විට අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය වූයේද එම මුදල විදේශීය මුදලින්ම තැන්පතුවක් ලෙස පවත්වාගෙන යාම වඩා සුදුසු බවය. | විදේශ මුදලින් ආරම්භ කර බැංකු ගිණුම් එම ගිණුම ආරම්භ කිරීමේ පරමාර්ථ සඳහා භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සංස්ථාව විසින් ඉකුත් වර්ෂයේ සිට දියත උයන පරිශ්‍රයේ ක්‍රියාත්මක කරනු ලබන බෝට්ටු සේවා වලින් අයකරන ගාස්තු ඒ වෙනුවෙන් දරණ වියදම් පියවා ගැනීමට ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සාමාලෝචිත වර්ෂයේ සංස්ථාවට සිදුවූ පාඩුව රු.මිලියන 16.96 ක් විය. | මෙය අලාභදායක තත්වයක් වුවත්, මගී ප්‍රවාහන බෝට්ටු සේවාව යන්න මහජනතාව අතර ජනප්‍රිය කරවීමේ අරමුණින් ක්‍රියාත්මක නියමු ව්‍යාපෘතියක් ලෙස එය පවත්වාගෙන යාම සඳහා සංස්ථා අධ්‍යක්ෂක මණ්ඩලයෙහි අනුමැතිය ලබාගෙන තිබේ. | ව්‍යාපෘති වියදම් ඵලදායීව කළමණාකරනය කර ව්‍යාපෘතිය ලාභදායී ලෙස පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදි සංස්ථාව විසින් ක්‍රියාත්මක කළ මහා භාණ්ඩාගාර ව්‍යාපෘති 64 ක් වෙනුවෙන් රු. මිලියන 1559.62 ක් වැය කළද, ඒ වෙනුවෙන් ලැබුණු මුදල රු. මිලියන 1,348.73 ක් වුයෙන් එම ව්‍යාපෘති වලින් සංස්ථාවට සිදුවූ පාඩුව රු. මිලියන 201.89 ක් විය. මෙම ව්‍යාපෘති සේවා කටයුතු වෙනුවෙන් මහා භාණ්ඩාගාරය සංස්ථාවට සියයට 17 ක සේවා ආදායමක් ලබා දුන්නද මෙලෙස පාඩුවක් සිදු වීම විගණනයේදි ප්‍රශ්නකාරි විය. | මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල ව්‍යාපෘති වලින් සංස්ථාවට වූ දළ අලාභය රුපියල් මිලියන 112 කි. | තාත්වික හා නිවැරදි ඇස්තමේන්තු පිළියෙල කර එම මුදල් භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර ව්‍යාපෘති නියමිත පරිදි කළමනාකරණය කර පිරිවැය අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්තමානයේ සිදුවන අනවසර ඉඩම් ගොඩකිරීම් වළක්වාලීමට සංස්ථා පනතේ පවතින විධිවිධාන ප්‍රමාණවත් නොවන බැවින් එම වගන්ති නිවැරදි කර පනත සංශෝධනය කිරීම සඳහා 2012 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පනත සංශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම පනතේ පවතින අඩුපාඩු මත අනවසර ඉඩම් ගොඩකිරීම් සම්බන්ධව සංස්ථාවට ලැබෙන පැමිණිලි වෙනුවෙන් ප්‍රමාණවත් පියවර ගැනීමට සංස්ථාව නොහැකි වී තිබුණි. | අදාළ සංශෝධිත පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන හා නොගැටෙන බවට සහතිකය නීතිපති දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කිරීමට නියමිතය. | සංස්ථා පනත කඩිනමින් සංශෝධනය කර ගැනීමට අමාත්‍යාංශයේ මැදිහත් වීම මත කඩිනම් පියවර ගත යුතුය |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් වෙළඳපලේ පැවති රු. මිලියන 801 ක් වටිනා ඉදිකිරීම් කොන්ත්‍රාත් 06 ක් සඳහා පමණක් තරගකාරි ලෙස ලංසු | 2018 වර්ෂයේ දී තරඟකාරී කොන්ත්‍රාත් 6 කින් 3ක් ලබාගත් අතර, ඉදිරියේදී මෙම ප්‍රවණතාව වැඩිකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමු. | සංස්ථා පනතේ අරමුණක් වන ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තරඟකරුවකුවීම යන අරමුණු ඉටු කර ගැනීමට ඵලදායීව කොන්ත්‍රාත් |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් කර තිබුණු අතර ඉන් රු. මිලියන 296 ක කොන්ත්‍රාත්තු 03 ක් පමණක් ලබාගෙන තිබුණි. මෙම තත්ත්වය අනුව සංස්ථාව විවෘත වෙළඳපලේ පවතින තරගකාරි කොන්ත්‍රාත් ලබා ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුනු අතර මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ලැබෙන කොන්ත්‍රාත් කටයුතු පමණක් ඉටු කිරීම නිසා සංස්ථාවට ලබා ගත හැකිව තිබූ වෙළඳපල කොටස අහිමි වී තිබුණි. | | කළමනාකරණය සිදු කළ යුතුය. |
| (ඈ) | සංස්ථාව සතු ඉඩමක්, සාවද්‍ය ලෙස කරුණු වරදවා දක්වා 2000 අප්‍රේල් 06 දින බාහිර ගැණුම්කරුවකු වෙත රු. මිලියන 5.83 කට විකිණීම හේතුවෙන්, එම ගැණුම්කරු විසින් අධිකරණයේ නඩු පවරා තිබූ අතර නඩුවේ තීන්දුව අනුව සමාලෝචිත වර්ෂයේදි එම ගැණුම්කරුවෙත රු.මිලියන 12.28 ක් ගෙවීමට සංස්ථාවට සිදුව තිබුණි. තවද මෙම කරුණුවලට වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | අංක 100/SLLRDC දරණ සැලසුම පිළියෙල කර තිබූ නමුත් නිවාස ඉදිකිරීමේදී 42/SLLRDC දරණ සැලසුම භාවිතා කර ඇති බැවින් එම සැලසුම යටතේ ටෙන්ඩර් කැඳවීම සිදුකර ඇති බව ගොනුවේ තොරතුරු අනුව පෙනීයයි. | සාවද්‍ය ලෙස කටයුතුකළ නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගෙන අලාභය ප්‍රතිපූර්ණය කර ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ යන්ත්‍රෝපකරණ අංශයේ අලාභය රු. මිලියන 97 ක් වූ අතර එහි වාර්ෂික පිරිවැය වූ රු. මිලියන 568 තුළ රු. මිලියන 373 ක ශ්‍රම පිරිවැයක් ඇතුළත්ව තිබුණු අතර මුළු පිරිවැයෙන් ප්‍රතිශතයක් ලෙස එම අගය සියයට 66 ක් විය. යන්ත්‍රෝපකරණ අංශයේ අතිරික්ත සේවක පිරිසක් සිටීම මෙම තත්ත්වයට සෘජුව බලපා තිබුණි. | යන්ත්‍රෝපකරණ අංශය තුල ස්ථිර සේවකයින් 400 ඉක්මවා ඇති අතර, අංශයේ වැටුප් අගය ඉතා ඉහල අගයක පවතී. | සංස්ථාවේ අතිරික්ත සේවකයන් ඵලදායීව සංස්ථාවේ අංශ අතර යෙදවිය යුතුය. |

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මහ කොළඹ ගංවතුර පාලනය සහ පාරිසරික වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ සංස්ථාවට පැවරුණු ඉඩම් හෙක්ටයාර 378 ක් 1996 අගෝස්තු 15 දිනැති අංක 96/1760/111/125 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කෙටිකාලීන බදු පදනම මත ලබාදීමට සංස්ථාව කටයුතු කර නොතිබීම හේතුවෙන් වර්ෂ 20 කට වැඩි කාලයක සිට සංස්ථාවට රැස්කර ගත හැකිව තිබූ බදු කුලී ආදායමක් අහිමි වී තිබුණි. එසේ පැවරුණු ඉඩම් වල අනවසර පදිංචිවීම් හා අනවසර ගොඩකිරීම් ඉවත් කිරීමේ සම්පූර්ණ වගකීම (Sole Responsibility) සංස්ථාවට පැවරී තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් ඉඩම් අක්කර 76 ක් පමණ අනවසර පදිංචි කරුවන් විසින් අත්කරගෙන තිබීම හා තවත් අක්කර 81 ක් සංස්ථාව විසින් අවසතු කරනය (Divesting) කර තිබීම හේතුවෙන් අමාත්‍ය මණ්ඩලය විසින් සංස්ථාවෙන් අපේක්ෂා කරන ලද කාර්යය ඉටුකිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි | විගණන නිරීක්ෂණයේ සඳහන් පරිදි මායිම් ඇළවලින් පිටත පිහිටි කුඩා බිම් කොටස් බදුදීම සම්බන්ධයෙන් අමාත්‍යාංශයෙන් උපදෙස් ලබා ගැනීමටත් ඒ අනුව ඉදිරි කටයුතු කිරීමටත් තීරණය කර ඇත. 2014 වර්ෂයේ සිට මේ දක්වා මහකොළඹ ගංවතුර පාලන ව්‍යාපෘතිය යටතේ රජයට පවරාගත් ඉඩම් වල මායිම් නැවත ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අනවසර අල්ලා ගැනීමේ ව්‍යාපෘතිය යටතේ කෝට්ටේ, කොළොන්නාව, පාර්ලිමේන්තු ඉහල ජලාධාරය හා හීන් ඇළ තෙත්බිම් වලට අදාලව මායිම් කණු 1519 ප්‍රමාණයක් සිටුවා ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි සංස්ථාවට පැවරුණු ඉඩම් අදාළ අරමුණු සහ කාර්යයන් වෙනුවෙන් භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක 16/0204/724/014 හා 2016 ජනවාරි 22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඇළ මාර්ග හරහා මගී ප්‍රවාහන ජාලයක් හඳුන්වා දීමටත් බෝට්ටු භාවිතා කරමින් විනෝදාස්වාදය ලබා දීමට සහ පාවෙන වෙළඳ පළවල් ඉදි කිරීම සඳහා අවසර ලබා දී තිබුණද සමාලෝචිත වර්ෂය අවසානවන විට සංස්ථාව මහා භාණ්ඩාගාර මුදල් භාවිතා කරමින් ජැටි 03 ක් පමණක් ඉදිකර තිබුණි. එබැවින් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි මගී ප්‍රවාහන සේවාවක් ආරම්භ කිරීම සංස්ථාව අපොහොසත් වී තිබුණි. | බේරේ වැව ඔස්සේ නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව එම අත්දැකීම් හා උගත් පාඩම් ඇසුරු කර ගනිමින් වැල්ලවත්ත-බත්තරමුල්ල ඇළ මාර්ගය ඔස්සේද බෝට්ටු සේවා සුදුසු ක්‍රමවේදයක් ඔස්සේ හඳුන්වාදීමට කටයුතු කරනු ඇත. | අමාත්‍ය මණ්ඩල තීරණය තුළ සඳහන් කාර්යයන් ඉටු කර නියමිත සේවාවන් ජනතාව වෙත ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1968 අංක 15 දරන ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථා පනතේ 2(ආ) 1 වගන්තිය අනුව දිවයින පුරා පළාත් මට්ටමින් පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම් පාලනය කිරීම හා අධීක්ෂණය කිරීමට හැකිවන පරිදි ඒවා ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීමට සංස්ථාව වෙත බලය පවරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට එලෙස ගැසට් කරන ලද පලාත් ගණන 06 කට සීමා වී තිබුණි. එසේම පනතේ 8 (අ) වගන්තිය අනුව ගොඩකිරීමට හා සංවර්ධනය කිරීමට පවරා ගනු ලබන ඉඩම්, ගොඩනැගිලි ඉදිකිරීමට, කර්මාන්ත වාණිජ්‍ය හා කෘෂිකාර්මික කටයුතු වෙනුවෙන් වැඩි දියුණු කළ යුතු වුවද, සංස්ථාව විසින් එලෙස 1995 වර්ෂයේදි සංවර්ධන කටයුතු සඳහා පවරාගත් මුතුරාජවෙල හා මුදුන් ඇල ප්‍රදේශවල ඉඩම් අක්කර 800ක ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 23 ක කාලයක් ගතව තිබුනද ඉන් වැඩි දියුණු කළ ප්‍රමාණය අක්කර 522 ක් එනම්, සියයට 65 ක පහල අගයක් විය. | මුතුරාජවෙල සංවර්ධනය කිරීමට යෝජිත බිම් ප්‍රමාණයෙන් කොටසක් මුහුදු වැලි එක්රැස්කර තැබීමට භාවිතා කරන අතර කොටසක් කසළ කළමනාකරණ ව්‍යාපෘතීන් සඳහා භාවිතා කර ඇත. ඉතිරි ඉඩම් කොටස් පිරවීම සඳහා පස්වල ඇති හිඟකම හේතුවෙන් මුහුදු වැලි පොම්ප කිරීමට සැලසුම් ක්‍රියාත්මක කරමින් පවතී. | පනතේ ඇතුළත් විධි විධාන අනුව පවරාගත් ඉඩම් අදාළ කාර්යයන් සඳහා යොදවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 කට අදාලව ජල රැඳවුම් ප්‍රදේශ තුල සිදුකර ඇති අනවසර ඉදිකිරීම් සහ ගොඩකිරීම් 1321 ක් හඳුනාගෙන තිබුණද එම හඳුනාගත් ඉදිකිරීම් ඉවත් කිරීමට අපොහොසත්ව තිබුණි. | සංස්ථාව මගින් ඉවත් කිරීමට හැකියාව ඇති ගොඩකිරීම් හා ඉදිකිරීම් සංස්ථාව මඟින් ඉවත් කිරීමට කටයුතු කරනු ලබයි. හඳුනාගන්නා ලද සෑම අනවසර ගොඩකිරීමක් ම හෝ ඉදිකිරීමක් ම, ඉවත් කිරීම සඳහා සංස්ථාව සතුව බලතල නොමැති අතර, අධිකරණමය තීන්දුවක් මගින් එම කටයුතු සිදුකළ යුතු ය. | සංස්ථා පනතේ සඳහන් බලතල ප්‍රකාරව අනවසර ඉදිකිරීම් හා ගොඩකිරීම් සම්බන්ධව සංස්ථාව කඩිනමින් පියවර ගත යුතුය. |
| (ඉ) | ශ්‍රී ජයවර්ධනපුර අභය භූමිය තුළ පිහිටි දියසරු උද්‍යානයෙහි යෝජිත ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා අදාළ ආයතනවලින් පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව සංස්ථාව ඉදිකිරීම් කටයුතු සිදු කිරීම හේතුවෙන් එම ඉදිකිරීම් නවතා දමන ලෙස වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සංස්ථාවට දන්වා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 3.48 ක් වැයකර සිදුකළ | මූලික පාරිසරික අධ්‍යන වාර්තාවක් 2019 අගෝස්තු මස වනජීවී දෙපාර්තමේන්තුව වෙත ලබාදෙන ලදී. එහි අනුමැතිය ලද වහාම ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු යොදා ඇත. | ඉදිකිරීම්වලට අදාළ පූර්ව අනුමැතින් ලබා ගැනීමෙන් පසුව ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංවර්ධන කටයුතු නවතා දමා තිබුණු අතර එම කටයුතු 2019 අගෝස්තු වන විටත් නැවත ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. | | |
| (ඊ) | මුහුදු වැලි කියුබික් මීටර් මිලියන 4 ක් ඇමරිකානු ඩොලර් මිලියන 19.97 කට ලබා ගැනීමට විදේශ සමාගමක් සමඟ සංස්ථාව 2018 අප්‍රේල් 10 දින ගිවිසුම් ගතව තිබුණු අතර එයට අදාළ අවබෝධතා ගිවිසුම අනුව 2019 ජුනි 30 වන විට වැලි කියුබික් මීටර් මිලියන 4 ක් ගොඩදැමීමට එකඟ වී තිබුණි. නමුත් එදිනට සංස්ථාවට වැලි ඝන මීටර් 2,120,480 පමණක් ලැබී තිබුණු අතර ඒ වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට අදාළ කොන්දේසි ගිවිසුමෙහි ඇතුළත් කර නොතිබුණි. . එමෙන්ම තවදුරටත් ලබාගත යුතු වැලි කියුබ් මීටර් මිලියන 1.88 ක් ලබා ගැනීමට සංශෝධිත කාල රාමුවක් නොවුණි. | මෝසම් කාලගුණය සහ ඩ්‍රෙජර් යන්ත්‍රයෙහි නඩත්තු කටයුතු හේතුවෙන් එය 2019 මාර්තු 20 වන දින රැගෙන ගියද කැනීම් කටයුතු සිදු නොකොට, දැනට රැස් කරගෙන ඇති වැලි තොග මඟින් වෙළඳ පොළ ඉල්ලුම සපුරාලීමට හැකියාව ඇති අතර ඩ්‍රෙජර් යන්ත්‍රය නැවත පැමිණි පසු ගිවිසුම්ප්‍රකාර ඉතිරි වැලි ප්‍රමාණය සංචිත කිරීමට බලාපොරොත්තු වේ. | ගිවිසුම් ප්‍රකාර වැලි තොග රැස්කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සංස්ථාව විසින් මූලික ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මාදින්නාගොඩ අතුරු ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 112 ක් වැය කර තිබුණද ව්‍යාපෘතිය ආරම්භ කිරීමෙන් පසුව ඉඩම් අත්පත් කර ගැනීමට සංස්ථාව කටයුතු කිරීම හේතුවෙන් ඇති වූ ගැටළුකාරී තත්ත්වයන් මත මෙම ඉදිකිරීම් අතර මග නවතා තිබුණි. එබැවින් මෙම ව්‍යාපෘතිය සඳහා දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය. | සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රවේශ මාර්ගයක් නොමැති බැවින් ඒ සඳහා ප්‍රවේශ මාර්ගය ඉදිකරන ලද අතර, එය අනාගතයේදී ඇතිවිය හැකි මාර්ග තදබදය අවම කරගැනීම සඳහා අතුරු මාර්ගයක් ලෙසද භාවිත කිරීම සඳහා එය බුත්ගමුව මාර්ගයට සම්බන්ධ කල යුතුව ඇති අතර, එම ඉඩම් අත්පත් කරගැනීමේදී ගැටළු මතුවිය. | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර එම ව්‍යාපෘති පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් කර ඇතිවිය හැකි ගැටලු කලින් හඳුනාගෙන ගැටලුකාරී තත්ත්වයන් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | සංස්ථාව නිසි මූලික අධ්‍යයනයකින් හා සැලසුමකින් තොරව බොල්ගොඩ ඇලෙහි ඉවුරු සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් එම ඇල ඉවුරු කඩා වැටීම නිසා ව්‍යාපෘතිය අතර මග නවතා දමා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ ඇල ඉවුරු නැවත ප්‍රතිසංස්කරණය සඳහා සංස්ථාව රු.මිලියන 15.23 ක් වැය කර තිබුණි. | අවදානම් තත්වය අවම මට්ටමේ පැවැති හා කලහැකි ඇළ මාර්ග ඉවුරු කොටස් පමණක් සිදුකොට ඉතා අවදානම් ඇළ ඉවුරු කොටස් සිදුනොකොට සංවර්ධන කටයුතු නතර කරන ලදී. | ව්‍යාපෘති ආරම්භ කිරීමට පෙර ශක්‍යතා හා තාක්ෂණික අධ්‍යයනයක් කිරීම මගින් ඇතිවිය හැකි අවධානම් අවම කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථා පනතේ විධි විධාන ප්‍රකාරව සංස්ථාවට වෙනත් පාර්ශවයකට ණය ලබා දීමට නොහැකි වුවද සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂයේදි සිය පරිපාලිත සමාගම වෙත මුහුදු වැලි පැකට් කර විකිණීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් රු. මිලියන 200 ක ණය මුදලක් ලබා දීමට එකඟ වී ඉන් රු. මිලියන 118.75 ක ණය මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ලබා දී තිබුණු අතර මේ සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹ තිබුණේ 2019 අප්‍රේල් 04 දින විය. එමෙන්ම මෙම ණය මුදල නැවත ගෙවීමට සමාගමට ඇති හැකියාව පිළිබඳවද සංස්ථාව ඇගයීමටක ලක් කර නොතිබුණි. තවද මෙම තත්ත්වය 2003 ජුනි 02 දිනැති පීඊඩී 12 දරණ යහපාලන පිළිබද මාර්ගෝපදේශ සංග්‍රහයේ අංක 8.1.4 වගන්තියටද පටහැනි විය. | සංස්ථාව යටතේ ඇති REDECO සමාගම විසින් කර ගෙන යනු ලබන මුහුදු වැලි සේදීමේ හා පැකට් කිරීමේ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහිතව වාණිජ පොළී අනුපාත යටතේ රුපියල් මිලියන 200 ණය මුදලක් වසර 12 කින් ගෙවීමේ පදනම මත ලබා දී ඇත.<br><br>මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර සාර්ථක වූ පසු ලබා දුන් ණය මුදල සහ පොළියද, ඊට අමතරව REDECO ආයතනයෙන් සංස්ථාවට ලැබිය යුතු අනෙකුත් මුදල් අයකර ගැනීමට බලාපොරොත්තු වේ. | සංස්ථාව ණය මුදල් ලබාදීමේදි එම මුදල නැවත අයකර ගැනීමේ ශක්‍යතාව අධ්‍යනය කළ යුතු අතරම පනතේ බලතල ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.5 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථාව සතු බෙල්ලන්විල පැවැති වෙළඳ කුටි 06 ක් 2016 වර්ෂයේ සිට කුලී පදනම මත ලබා දීමට කටයුතු නොකර වසා දමා තිබුණු අතර, එම හේතුවෙන් සංස්ථාවට අහිමි වූ ආදායම රු.මිලියන 21.60 ක් පමණ විය. | වෙළෙඳ කුටි 06 ඇතුළුව ඉහළ මාලයත් ශරීර සුවතා මධ්‍යස්ථානයක් (a Gymnasium) සහ වෙනත් ව්‍යාපාරික අවස්ථාවන් ලෙස භාවිතාකිරීමේ හැකියාව පිළිබඳව සංස්ථාව මේ වනවිට සලකා බලමින් සිටී. | සංස්ථාවේ වත්කම්, කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීම තුළින් ආදායම් ලබා ගැනීමට පියවර ගත යුතුය. |

## 3.6 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයට සේවාදායක ව්‍යාපෘතියක් වූ කිරි මණ්ඩල මාවත යෝජිත ගංවතුර පාලන සහ ජල සම්පත් කළමණාකරන මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ වැඩ ඉකුත් වර්ෂයේදි ආරම්භ කර සමාලෝචිත වර්ෂයේදි අවසන් වීමට නියමිතව තිබුණද එදිනට කොන්ත්‍රාත්තුවේ මුල්‍ය සහ භෞතික කාර්ය සාධනය පිළිවෙලින් සියයට 10 ක් හා සියයට 15 ක පහළ මට්ටමකට පැවතුණි. සංස්ථාවේ කොන්ත්‍රාත් කටයුතු සම්බන්ධව නිසි කළමනාකරණයක් නොවීම මෙම තත්ත්වයට බලපා තිබුණි. තවද මෙම කොන්ත්‍රාත්තුවෙන් සංස්ථාවට අලාභයක් සිදු වීමේ අවධානම විගණනයේදි බැහැර කළ නොහැකි විය. | ඇස්තමේන්තු සකස් කර ඇත්තේ 2017 වර්ෂයේ බැවින් මෙම මිල ගණන් යටතේ ව්‍යාපෘතිය කරගෙන යෑමේදී ව්‍යාපෘතිය පාඩු ලැබිය හැකි බවත් මෙම මිල ගණන් අද පවතින මිලට සංශෝධනය කරන ලෙසත් අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත. සැලසුම් සංශෝධනය කිරීමටත් පවතින රජයේ නීති රෙගුලාසි අනුව ප්‍රසම්පාදනය සිදු කල යුතු වීමත් හේතුවෙන් ඒ සඳහා ද කාලයක් ගත විය. තවද රට තුල ශ්‍රම කම්කරු හිඟතාවයක් පැවති අතර ශ්‍රම කම්කරුවන් බඳවා ගැනීමට ඇබෑර්තු කැඳවුවද අවශ්‍ය ප්‍රමාණයට කම්කරුවන් බඳවා ගැනීමට නොහැකි වූ බැවින් වැඩබිමේ ඉදිකිරීම් කටයුතු සැලසුම්ගත ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වීමට සෘජුව බලපාන ලදි. | සංස්ථාව භාරගත් කොන්ත්‍රාත් කටයුතු නිසි කළමනාකරණයක් යටතේ අනුමත කාල රාමුවක් තුළ නිම කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පිරිවැය රු. මිලියන 51.10 ක් වූ සංස්ථාව භාරගත් උපදේශන සේවා කොන්ත්‍රාත් 7 ක සමාලෝචිත වර්ෂය අවසානයට භෞතික ප්‍රගතිය සියයට 65 ත් 100 ත් අතර ප්‍රමාණයකින් පැවතියද කිසිදු මුල්‍ය ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි. එසේම ඉකුත් වර්ෂය තුළ වැඩ ආරම්භකරන ලද රු. මිලියන 26.76 ක උපදේශන සේවා කොන්ත්‍රාත් 10 ක වැඩ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් කර නොතිබුණි. | රු.මි. 24.16 ක් වන උපදේශන සේවා කොන්ත්‍රාත් 8 කින් කොන්ත්‍රාත් 5 ක වැඩ සමාලෝචිත වර්ෂයේදී අවසන් කරන ලද අතර, කොන්ත්‍රාත් 3 ක වැඩ නිම කිරීමට නොහැකි විය. | සංස්ථාව භාරගත් කොන්ත්‍රාත් අදාළ කාල රාමුව තුළ ඉටු කිරීමට අවශ්‍ය පියවර කඩිනමින් ගත යුතුය. |
| (ඇ) | 2013 අගෝස්තු 30 දිනැති අංක 13/1144/503/087 දරන අමාත්‍ය මණ්ඩල තීරණයක් මත වේරස්ගඟ වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කොට ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 14,227 ක ණය මුදලක් මහා භාණ්ඩාගාර ඇපකරය | 2018 වසර අග භාගයේදී රටේ පැවති දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් යෝජිත කාර්යයන් සඳහා අදාල ප්‍රසම්පාදන අනුමැතියන් ලබා ගැනීමට ප්‍රමාද වීමෙන් සැලසුම් කළ පරිදි ව්‍යාපෘති කටයුතු සිදුකිරීමට නොහැකි විය. ඉඩම් අත්කර ගැනීමේ ක්‍රියාවලිය සඳහා ද සංස්ථාවට මහත් පරිශ්‍රමයක් හා | ණය ලබා ගැනීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ව්‍යාපෘතිය නියමිත කාල රාමුවක් තුළ ඉටුකර ව්‍යාපෘතියේ අරමුණුගත ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ ලබාදීමට කටයුතු කළ යුතුය. |

මත ජාතික ඉතිරිකිරීමේ බැංකුව මඟින් සංස්ථාව වෙත ලබා දී තිබුණි. ඒ අනුව සංස්ථාව විසින් 2014 ජූලි 14 දින වසර 14 ½ කින් ණය මුදල ආපසු ගෙවීමේ එකඟතාව මත ජාතික ඉතිරි කිරීමේ බැංකුව සමඟ ණය ගිවිසුමකට එළඹ තිබුණි. නුගේගොඩ, රත්තනපිටිය, බොරලැස්ගමුව, පිළියන්දල හා වේරහැර ප්‍රදේශ වල වර්ෂා සමයේ හටගන්නා ගංවතුර පාලනය කිරීම , පවතින ඇළ මාර්ග පුළුල් කිරීම, ඇළ ඉවුරු ආරක්ෂාව, ගංවතුර රැඳවුම් ප්‍රදේශ ආරක්ෂාකරමින් වැව් ඉදිකිරීම, නව බෝක්කු හා පාලම් ඉදිකිරීමද ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු විය. එමෙන්ම 2017 දෙසැම්බර් 07 දිනැති හා අංක අමප/17/2561/724/112 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි රු. මිලියන 14,227 ක් සඳහා එකග වූ ණය ගිවිසුම අහෝසි කර එදිනට ලබාගත් ණය මුදල වන රු. මිලියන 2,550 වෙනුවෙන් නව ණය ගිවිසුම එළඹීමට සහ අදාළ ණය වාරික හා පොලී ගෙවීමට අවශ්‍ය මුදල් හා ව්‍යාපෘතිය අඛණ්ඩව කර ගෙන යාම සඳහා වන වියදම වාර්ෂික අයවැය මඟින් ප්‍රතිපාදනය කිරීමටද යෝජනා වී තිබුණි. එසේ වුවත් ව්‍යාපෘතියේ අසාමාන්‍ය කාල ප්‍රමාදයක් වලක්වා ගෙන නියමිත කාලයට ව්‍යාපෘතිය නිම කළ හැකි නව වැඩ පිළිවෙලක් කළමනාකරණය විසින් හඳුන්වාදී නොතිබුණි. එසේම රු.මිලියන 71.60 ක කොන්ත්‍රාත්කරුවන්ට ලබාදුන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් අසාමාන්‍ය කාලයක් කොන්ත්‍රාත්කරුවන් අත රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

විශාල කාලයක් වැය කිරීමට සිදු වීම ද ප්‍රමාද වීම් වලට බලපා තිබුණි. ප්‍රමාද කාලය වසර ඉක්මවූ ශේෂයන් ඇති උපකොන්ත්‍රාත් සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රමාදයන් බලපා ඇත.

## 3.7 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂ 03 කට අදාල (2017-2020) ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ඇතුලත් වන පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සංස්ථාව විසින් පිළියෙල කර නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක්ද පිළියෙල නොකර උප ක්‍රියාකාරකම්වලට අදාල සැලැස්මක් පමණක් පිළියෙල කර තිබුණි. එම උප ක්‍රියාකාරකම්වලට අදාල ඇස්තමේන්තුගත වටිනාකම් හා එම වටිනාකම්වලට අදාලව පත්කල යුතු ප්‍රසම්පාදන කමිටුව කුමක්ද යන්න හා ප්‍රසම්පාදනයන්ට අදාල නිවැරදි කාල පරාසයන් සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. තවද රජයේ ප්‍රදාන සඳහා පමණක් එම උප සැලැස්ම සකස්කර තිබු අතර සංස්ථාවේ ව්‍යාපෘති හා සේවාදායක ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදන කටයුතු එහි ඇතුළත් කර නොතිබුණි. | ඉදිරියේදී මෙම වාර්තාවට අනුව ප්‍රසම්පාදන සැලසුම් සැදීමට කටයුතු සිදු කරනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර සියලුම ප්‍රසම්පාදන කටයුතු අදාළ සැලැස්මට අනුකූලව සිදු කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්ති අනුව, කොන්ත්‍රාත්කරුට ප්‍රතිග්‍රහණ ලිපිය නිකුත් කළ විගස පාර්ශවකරුවන් කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹිය යුතු වුවද සමාලෝචිත වර්ෂයේදි සංස්ථාව විසින් රු.මිලියන 19.52 ක් වටිනා කොන්ත්‍රාත් 03 ක් පිරිනැමීමේදි එලෙස ගිවිසුමකට එළඹ නොතිබුණි. | ප්‍රදාන ලිපිය දෙපාර්ශවය විසින් නිත්‍යානුකුල ලියකියවිලි ලෙස භාවිතා කරනු ලැබේ. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් විධි විධාන අනුගමනය කර ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 වගන්තිය අනුව වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය යටතේ (Shopping) භාණ්ඩ මිලදී ගැනීමේදී අවම වශයෙන් ලංසු මිල ගණන් 03 ක් ඇගයීමට ලක් කර මිලදී ගැනීම සිදු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ සංස්ථාව සිදු කළ රු. මිලියන 11.09 ක් වටිනා ප්‍රසම්පාදන 06 ක් මෙම අවශ්‍යතාවයට පටහැනිව එක් ලංසුවක් පමණක් ඇගයීමට ලක් කර මිලට ගෙන තිබුණි. | සඳහන් පරිදි ලියාපදිංචි හා කහ පිටුවල (yellow pages) සැපයුම්කරුවන් 05 කට වඩා වැඩි ප්‍රමාණයකට ආරාධනා කර සිදු කර ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ සඳහන් විධි විධාන අනුගමනය කර ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව ඔලියමුල්ල පොම්පාගාරය වෙනුවෙන් රු. මිලියන 82.90 ක් වටිනා ජල පොම්ප 02 ක් මිලදී ගෙන සවිකිරීමට කටයුතු කර තිබුණද, එම සැපයුම්කරුට සේවා මධ්‍යස්ථානයක් නොමැති බැවින් පොම්පවල නඩත්තු කටයුතු කිරීමේ අවධානමක් ඇති වී තිබුණි. ලංසු ලියවිලි අනුව ලංසු කැඳවීමේදී සේවා මධ්‍යස්ථානයක අවශ්‍යතාව සඳහන් කර තිබියදීත් ඒ බව නොසලකා මිලට ගැනීම් සිදුකර තිබීම ප්‍රශ්ණකාරී තත්ත්වයක් විය. | ඔලියමුල්ල වැසි ජලය අපවහන හා පරිසරය වැඩි දියුණු කිරිමේ ව්‍යාපෘතිය යටතේ ඉදිකිරිමට නියමිත පොම්පාගාරය සඳහා මිලදී ගෙන ඇති පොම්ප නඩත්තු කටයුතු අවම දීර්ඝ කාලීන කල්පැවැත්මක් සහතික කර ඇති පොම්ප වේ. | යන්ත්‍ර මිලදී ගැනීමේදී අලෙවියෙන් පසු සේවා ලබා ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳ අවධානය යොමුකළ යුතුය. |
| (ඉ) | සංස්ථාවේ සියළුම ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා වෙනම සැපයුම් අංශයක් ස්ථාපිත කර තිබියදී එම අංශයේ අනුදැනුමකින් තොරව සමාලෝචිත වර්ෂයේ වේරස් ගඟ වැසි ජලය අපවහනය හා පරිසර වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු. මිලියන 523.5 ක් වටිනා ප්‍රසම්පාදන් 19 ක් සිදුකර තිබුණි. | මෙම කාර්යයන් ව්‍යාපෘතිය මඟින් කරනු ලබන්නේ සංස්ථා සැපයුම් අංශය දෛනිකව විශාල කාර්යයක් කරනු ලබන හෙයින් ව්‍යාපෘතියේ අනු ව්‍යාපෘතීන්ට දෙනු ලබන කාලසීමාව යටතේ ඉක්මනින් නිම කළ යුතු ප්‍රසම්පාදන කටයුතු සැපයුම් අංශයෙන් නිම කිරීමට සැළකිය යුතු කාලසීමාවක් ගත වන බැවින් එය ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාවට අහිතකර අන්දමින් බලපෑ හැකිය. | ප්‍රසම්පාදන කටයුතු විනිවිද භාවයකින් කළ යුතුව හා සංස්ථාව හඳුන්වා දී ඇති පරිචයන්ට අනුව සිදුකළ යුතුය. |

## 3.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබා නොගෙන රු. මිලියන 545.06 ක් වටිනා සේවාදායක ව්‍යාපෘති 04 ක් සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කර තිබුණු අතර වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් නොගෙන කොන්ත්‍රාත් ඉටු කිරීම විගණනයේදී ප්‍රශ්නකාරී විය. තවද මෙම ව්‍යාපෘති සම්බන්ධව දෙපාර්ශවය අතර විධිමත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරිය විසින් කිහිපවරක් Mobilization Advance Payment Guarantee සංශෝධනය කිරීම සඳහා ඉල්ලුම් කල බැවින් අවසාන සංශෝධිත ලියකියවිලි 2018.07.03 වන දින වනවිට භාරදුන් හෙයින්ද ඒවනවිටත් පළමු බිල්පත යොමුකොට තිබු හෙයින්ද ස්ථානගත වීමේ අත්තිකාරම් මුදල (Mobilization Advance Payment) නිදහස් නොකොට පළමු බිල්පතට අදාල මුදල් මෙම සංස්ථාව වෙත ලබා දී තිබුණි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුව සේවාදායක කොන්ත්‍රාත් භාර ගැනීමට ප්‍රථම වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර කොන්ත්‍රාත් සම්බන්ධ පාර්ශවකරුවන් අතර විධිමත් ගිවිසුමක් ඇතිකර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී සංස්ථාව ක්‍රියාත්මක කළ සේවාදායක ව්‍යාපෘති 7 ක කළ වැඩ සඳහා සංස්ථාව අයකර නොගත් වටිනාකම රු. මිලියන 232.21 ක් වු අතර එය මුළු කළ වැඩ වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස සියයට 74 ක් විය. සංස්ථාව කාලීනව ඉන්වොයිස් ඉදිරිපත් නොකිරීම, අනුමැතියකින් තොරව අමතර වැඩ සිදු කිරීම, ප්‍රමාණ පත්‍ර රේටයන් අනුමත කර නොගැනීම, ඉදිකිරීම් කටයුතුවල ගැටළු ඇතිවීමට ඍජුව බලපා තිබුණි. | කෙරීගෙන යන ව්‍යාපෘති වෙනුවෙන් ඉදිරිපත් කරන ලද බිල්පත් සහතික කරගැනීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් සිදුවී ඇති අතර එය අදාල සේවාදායකයා හෝ උපදේශන සේවා සපයන ආයතනයේ ප්‍රමාදයන් සිදුවී ඇත. | සංස්ථාව විසින් භාරගත් කොන්ත්‍රාත් නිසි කළමණාකරනයකින් යුතුව ඉටුකළ යුතු අතර ඉදිකිරීම් ගැටළු අවම කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සංස්ථාව විසින් ඉටුකරන ලද කොන්ත්‍රාත් 98 ක කළ වැඩ වටිනාකම රු. මිලියන 5,110 ක් වූ අතර එයින් රු.මිලියන 1,076 ක් වූ කළ වැඩ සහතික කිරීමට සේවා දායකයින් කටයුතු කර නොතිබුණි. එමෙන්ම සහතික කරන ලද කළ වැඩ වටිනාකමින් තව දුරටත් සංස්ථාවට අයවිය යුතු වටිනාකම රු. මිලියන 391 ක් වූ අතර සේවාදායකයින් රඳවාගත් අත්තිකාරම් මුදල රු. මිලියන 258 | අදහස් දක්වා නැත. | කොන්ත්‍රාත් කටයුතු නිසි අධීක්ෂණයක් සිදුකර කළ වැඩ සහතික කර ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ක් විය. සංස්ථාව කොන්ත්‍රාත් කළමණාකරණය වෙනුවෙන් වැඩි අවධානයක් යොමු නොකිරීම එම තත්ත්වයට හේතුවී තිබුණි. | | |
| (ඇ) | වෙරස් ගඟ වැසි ජල අපවහන හා පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ රු. මිලියන 1340.60 ක ඇස්තමේන්තුගත කාර්යයන් සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කිරීමට සංස්ථාව සැලසුම් කළද ඊතය ලෙස රු. මිලියන 871.97 ක කාර්යයන් පමණක් ඉටු කර තිබුණි. මේ අනුව රු. මිලියන 468.63 ක වටිනාකමින් යුතු කාර්යයන් ඉටුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් මේ වෙනුවෙන් ලබාගෙන තිබුණු මුදල රු.මිලියන 1,205 ක් විය. | 2018 වර්ෂයේ මුල් කාර්තු වල සැලසුම් කළ ආකාරයට ව්‍යාපෘතියේ යෝජිත කාර්යයන් ඉටු කරමින් පැවතියද වර්ෂය අග භාගයේ රටේ පැවති දේශපාලන අස්ථාවරත්වය හේතුවෙන් යෝජිත කාර්යයන් සඳහා අදාළ ප්‍රසම්පාදන අනුමැතියන් ගැනීමේ අසීරුතාවන් හේතුවෙන් සැලසුම්ගත කාර්යන් නියමිත දිනයන්ට ඉටුකර ගැනීමට අපහසු විය. එම හේතුවෙන් අපේක්ෂිත මුළු කාර්යන් ඉටුකර ගැනීමට අපහසු විය. | සැලසුම් කළ පරිදි කොන්ත්‍රාත් වැඩ කටයුතු සැලසුම් කළ කාලය තුළ නිම කිරීමට කටයුතු කළ යුතුය. |

**3.9 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 1,875 ක් වූ අතර එදිනට තථ්‍ය කාර්ය මණ්ඩලය 1,431 ක් වීමෙන් සංස්ථාවේ කාර්ය මණ්ඩලයේ 405 ක පුරප්පාඩු තිබුණු අතර 39 දෙනෙකුගෙන් යුතු අතිරික්ත කාර්ය මණ්ඩලයක්ද විය. | ව්‍යාපෘති වල සේවා අවශ්‍යතාවයන් සැලකිල්ලට ගෙන අනුමත කාර්යය මණ්ඩලයේ පුරප්පාඩු අතුරින් අත්‍යාවශ්‍ය තනතුරු පිරවීමට කටයුතු කරනු ලැබේ. අංක 25/2014 හා 2014.11.12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව සේවකයින් ස්ථිර කිරීම මත සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව තුල සේවකයින් 39 දෙනෙකුගේ අතිරික්තයක් පෙන්නුම් කරයි. | සංස්ථාවේ අනුමත කාර්යය මණ්ඩලයට අනුව පුරප්පාඩු සහ අතිරික්ත තනතුරද සංශෝධනය කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයට සංස්ථාවේ පරිපාලිත සමාගම් වන ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමෙන් සහ එල් ආර් ඩී සී සේවා සමාගමෙන් වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත සංස්ථාවට බඳවාගත් කාර්ය මණ්ඩලය පිළිවෙලින් 126 ක් සහ 800 ක් වූ අතර මෙම කාර්ය | එල්. ආර්. ඩී .සී .සේවා සමාගමෙන්, ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සමාගමෙන් හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් බඳවා ගත සේවකයින්ගේ වැටුප් අදාළ ව්‍යාපෘතිවල BOQ වල අන්තර්ගතව ඇත .මෙම වියදම්, වාර්ෂික අයවැයේ ව්‍යාපෘතියේ පිරිවැය තුල ඇතුලත්ව ඇත . | සේවය සඳහා යොදාගන්නා අත්‍යාවශ්‍ය සේවකයින්ද ඇතුළත්ව සංස්ථාවේ අනුමත කාර්යය මණ්ඩලයේ සේවා අවශ්‍යතායන්ට අනුව සංශෝධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මණ්ඩලය වෙනුවෙන් සංස්ථාව සමාලෝචිත වර්ෂය අවසානයට වැටුප් වශයෙන් ගෙවන ලද මුදල රු.මිලියන 173.64 ක් විය. එසේ වුවද මෙම වියදම් සඳහා වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන් කරද නොතිබුණි. කෙසේ වෙතත් මෙම සේවකයින්ද ඇතුලත්ව කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. තවද උක්ත සඳහන් කාර්ය මණ්ඩලයට අමතර සමාලෝචිත වර්ෂයේදී සංස්ථාව විසින් සිය වැඩ බිම්වල කටයුතු සඳහා දිනකට රු.750 ක දීමනාවක් යටතේ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවෙන් සේවකයින් 175 දෙනෙකුගේ සේවයද ලබාගෙන තිබුණි. | | |
| (ඇ) | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත සංස්ථාවේ හිටපු සාමාන්‍යාධිකාරිවරිය තාවකාලික පදනම මත රේඛීය අමාත්‍යාංශයට මාරු කර යවා තිබුණි. සමාන්‍යාධිකාරිවරිය වෙනුවෙන් පවත්වන අභ්‍යන්තර විනය පරීක්ෂණයක් මෙම මාරු කිරීමට හේතුවන බවද තීරණය තුළ සඳහන්ව තිබුණි. නමුත් 2019 අගෝස්තු වන විට වර්ෂ 1 ½ වැඩි කාලයක් ගතව තිබුණද එවැනි විනය පරීක්ෂණයක් සංස්ථාව විසින් සිදුකර නොතිබීම විගණනයේදි මතභේදාත්මක කරුණක් වූ අතර සංස්ථාවට කිසිදු සේවාවක් ලබානොගෙන සමාලෝචිත වර්ෂය සඳහා එම නිලධාරිනියට අනෙකුත් පහසුකම් රහිතව වැටුප් වශයෙන් රු. මිලියන 2.29 ක්ද ගෙවා තිබුණි. | අධ්‍යක්ෂක මණ්ඩලයේ හා අමාත්‍යාංශයේ එකඟතාවය මත සංස්ථාවේ සාමාන්‍යාධිකාරි තාවකාලිකව 2017.12.29 දින සිට මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය වෙත අනුයුක්ත කර ඇත. එතුමියට විරුද්ධව මහාධිකරණයේ නඩු කටයුත්තක් පවතින බැවින්, එම නඩු කටයුත්ත අවසානයේදී ඇය සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග ගැනීම සුදුසු බවට අධ්‍යක්ෂක මණ්ඩලය තීරණය කර ඇත. 2019 අප්‍රේල් මස සිට සංස්ථාව මඟින් සාමාන්‍යාධිකාරිතුමියට වැටුප් ගෙවීමක් සිදු කරනු නොලැබේ. | අභ්‍යන්තර විනය පරීක්ෂණ විධිමත්ව සහ කාල රාමුවක් තුළ පවත්වා නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගත යුතුය. |

## 3.10 වාහන පද්ධතිය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදි ධාවන කටයුතු සදහා යොදා ගත් සංස්ථාවේ වාහන ගණන 102 ක් වු අතර කුලී පදනම මත ලබාගත් වාහන ගණන 36 ක් විය. සංස්ථාව සතු වාහන වලින් 18 ක් නිලධාරීන්ට අනුයුක්තව පැවැති අතර වාහන 19 ක් සංචිත වාහන ලෙස පැවතුණි. ඒ අනුව සංස්ථාවේ සංචිත වාහන ලෙස පැවැතිය යුතු වාහන 65 ක්. ප්‍රවාහන නිලධාරියාගේ අධීක්ෂණයකින් තොරව සංස්ථාවේ විවිධ අංශවලට අනුයුක්ත කර තිබුණි. මෙම වාහන සංස්ථාවේ ප්‍රවාහන අංශය මගින් පාලනය නොවන බැවින් ඒවා නිසි ධාවනයකට ලක් නොවන බව විගණනයේදි නිරීක්ෂණය වු අතර කුලී පදනම මත වාහන ලබාගැනීමට මෙම තත්ත්වය සෘජුව බලපා ඇති බව විගණනයේදි හෙළිදරව් විය. සංස්ථාව සතු වාහන සදහා සමාලෝචිත වර්ෂයේදි රු. මිලියන 28.15 ක් ඉන්ධන වෙනුවෙන් දරා තිබු අතර රු. මිලියන 51.54 ක් කුලී පදනම මත ලබාගත් වාහන සදහාද ගෙවා තිබුණි. | විගණන වාර්තාව මඟින් පෙන්වා දී ඇති පරිදි සංස්ථා සංචිතයේ හා සියලුම කුලී පදනම මත ලබාගෙන ඇති වාහන ප්‍රවාහන කළමණාකරුගේ අධීක්ෂණය යටතේ පවත්වා ගෙන යාමට අදාල ක්‍රියාමාර්ග ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. | සංස්ථාවේ වාහන ප්‍රවාහන අංශයේ මනා අධීක්ෂණයක් යටතේ ධාවනය කර කුලී වාහන ලබා ගැනීම අවමකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සංස්ථාව විසින් 2018 - 2022 වර්ෂ 05 ක කාල පරිච්ඡේදය සදහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් සංස්ථා පනත මඟින් පැවරී ඇති ප්‍රධාන කාර්යයන් වන දිවයින පුරා පිහිටි පහත් වගුරු බිම්, නිසරු හෝ මඩ ඉඩම් හඳුනාගෙන අනවසර ඉඩම් ගොඩකිරීම පාලනය කිරීම හා අධීක්ෂණය කිරීම, ඇල ඉවුරක ඇති යම් ඉඩම් ප්‍රදේශයක්, ඇල රක්ෂිත ප්‍රදේශයක් ලෙස හඳුනාගෙන එම රක්ෂිත ප්‍රදේශය තුල තාවකාලික හෝ වෙනත් ඉදිකිරීම් වැළකෙන පරිදි ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කිරීම එම සංයුක්ත සැලැස්ම ඇතුළත් කර නොතිබුණි. | පළාත් 3 ට අදාළ ප්‍රකාශයට පත්කිරීමේ කටයුතු ක්‍රියාත්මක වෙමින් පවතී.<br>ඇළ රක්ෂිත ඉදිරියේදී ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත්කිරීමටත්, සංයුක්ත සැලැස්ම සංශෝධනය කරනු ලබන අවස්ථාවකදී එකී කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුලත් කිරීමටත් කටයුතු කෙරේ. | සංස්ථා පනත මගින් පැවරී ඇති අරමුණු ඉටු කිරීමට ප්‍රමාණවත් පියවර ගත යුතුය. |

## 4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් නොවූ ව්‍යාපෘති 03 ක ඉදිකිරීම් වැඩ සඳහා රු. මිලියන 3.86 ක් සංස්ථාව වැයකර තිබුණු අතර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබූ වර්ෂය තුළ ක්‍රියාත්මක කළ යුතු රු. මිලියන 34.51 ක් වටිනා ව්‍යාපෘති 04 ක ඉදිකිරීම් කිරීමට සංස්ථාව අපොහොසත්ව තිබුණි. | ව්‍යාපෘති 3, 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුල ඇතුලත් නොවූයේ 2018 වර්ෂය වනවිට මෙම ව්‍යාපෘති වල කාර්ය සාධනයක් කිරීමට බලාපොරොත්තු නොවූ බැවිනි. | සංස්ථාවේ වාර්ෂික සැලැසුම අනුකූලව ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

## 4.3 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම සහ වියදම තථ්‍ය ආදායම හා වියදම සමඟ සැසඳීමේදී සියයට 9 සිට සියයට 67 ක් දක්වා වූ පරාසයක ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරනය පාලන කාරයකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත | අයවැය ලේඛනය ඵලදායි පාලන කාරයක් ලෙස භාවිතා කළ යුතුය. |

## 4.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය පරිදි ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද සංස්ථාව විසින් 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2019 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය |

**4.5 තිරසාර සංවර්ධන අරමුණු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පි/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබද එක්සත් ජාතින්ගේ වසර 2030 “ න්‍යාය පත්‍රය” අනුව සැම රාජ්‍ය ආයතනයක් විසින්ම තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුය. එසේ වුවත් සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් ඉහත අරමුණු ඉටුකර ගැනීම සඳහා කෙසේ ක්‍රියාත්මක කළ යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. එම හේතුවෙන් තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන්ද, හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති තිරසර සංවර්ධන දර්ශක හි ඇතුලත් තිරසර සංවර්ධන අරමුණු අතුරින් අපගේ සංස්ථාවෙහි විෂය පථයට ගැනෙන කාර්යයන් හඳුනාගෙන ඇති අතර, ඒ සම්බන්ධයෙන් ඉදිරි මාස කිහිපය තුලදී අවශ්‍ය කටයුතු සිදු කිරීමට සැලසුම් කර තිබේ. | තිරසර අරමුණු හා ඉලක්ක කඩිනමින් හඳුනාගෙන එම අරමුණු ලඟාකර ගැනීමට අවශ්‍ය සියලුම ක්‍රියාමාර්ග ගත යුතුය. |